# 2023/06/08 දින මීගහකිවුල ප්‍රාදේශීය සභාවේදී පැවති කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව

2023/06/08 වන දින පෙ.ව.09.00ට සභා ලේකම්තුමිය විසින් පැමිණ සිටි කලාප භාර විමර්ශන නිලධාරී ඩබ්.ඒ.එස්.ආර්.විජේසිංහ මහතා, ප්‍රජා සංවර්ධන නිලධාරී ඒ.එල්.ඒ.ඩී.චන්දිම මහතා, කාර්මික නිලධාරී ආර්.එම්.එල්.ජේ.රත්නායක මහතා, ප්‍රධාන කළමනාකරණ සහකාර(වැ.බ.) ජී.කේ.ද සොයිසා මහත්මිය, සංවර්ධන නිලධාරී ඒ.ජී.චිත්‍රා මල්කාන්ති මහත්මිය, කළමනාකරණ සේවා නිලධාරී කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම් මහතා හා විෂය නිලධාරී පිළිගනිමින් කළමනාකරණ කමිටුව ආරම්භ කරන ලදි.

මීළඟට, න්‍යාය පත්‍රානුකූලව සභා ලේකම්තුමිය විසින් 2023/05/25 දිනැති පසුගිය කමිටු රැස්වීම් වාර්තාව ඉදිරිපත් කරන ලදි. පසුගිය කමිටු රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බව ප්‍රජා සංවර්ධන නිලධාරී ඒ.එල්.ඒ.ඩී.චන්දිම මහතා යෝජනා කළ අතර එම යෝජනාව ප්‍රධාන කළමනාකරණ සහකාර(වැ.බ.) ජී.කේ.ද සොයිසා මහත්මිය ස්ථිර කළේය.

මීළඟට, න්‍යාය පත්‍රානුකූලව දිනට නියමිත කරුණු සාකච්ඡාවට භාජනය කරන ලදි.

I. ගමන් වියදම් හා ගෙවීම් වවුචර්පත් සඳහා අවශ්‍ය නිර්දේශය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කල වවුචර්පත්

a. ගමන් වියදම් හා ගෙවීම් වවුචර්පත්

| අනු අංකය | නම හා විස්තරය | ගෙවූ මුදල | කමිටු තීරණය |
|---|---|---|---|
| 1 | ඩී.ම්.ආර්.යු.කේ.දිසානායක මයා, ලංකා ඉන්ධන පිරවුම්හල, 14 කණුව, මීගහකිවුල - අප සභාව සතු රථ වාහන සඳහා 2023 මැයි මස 16 සිට 31 දක්වා ඉන්ධන ලබා ගැනීම. | 212,380.00 | නිර්දේශ කරන ලදි. |
| 2 | කළමනාකරු, රත්න සුපර් සිටි, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභා කාර්යාලයේ අල්මාරි සඳහා ඉබි යතුරු මිළදී ගැනීම වෙනුවෙන් ගෙවීම. | 4,895.00 | නිර්දේශ කරන ලදි. |
| 3 | කළමනාකරු, අයි.එස්.මාර්කටින්, නුවර පාර, මීගහකිවුල - මීගහකිවුල වෙසක් සැරසිලි සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් මිළ ගණන් පියවීම. | 4,110.00 | නිර්දේශ කරන ලදි. |
| 4 | කළමනාකරු, ටුල්මාර්ට් ආයතනය, පහල වීදිය, බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ වල්කපන යන්ත්‍රය අලුත්වැඩියා කිරිම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 6,850.00 | නිර්දේශ කරන ලදි. |
| 5 | එස්.එම්.නවෝදා දිලිනි මෙය, සංවර්ධන නිලධාරී - 2022 භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට තක්සේරු වාර්තාව ලබා දීමට පැමිණි නිලධාරීන්ට දිවා ආහාර ලබා දීම වෙනුවෙන් අතින් දැරූ වියදම් ගැනීම. | 3,730.00 | නිර්දේශ කරන ලදි. |
| 6 | ඩී.එම්.ධනපාල මයා, කෙසෙල්වත්ත, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ඩෙංගු මර්දන වැඩසටහනට සමගාමීව ජනතාව දැනුවත් කිරීම සඳහා ශබ්දවිකාශන යන්ත්‍රය ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 3,000.00 | නිර්දේශ කරන ලදි. |
| 7 | එච්.එම්.ධනුෂි වත්සලා මෙය, 14 කණුව, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභා කාර්යාල ඉදිරිපිට කඩකාමරය ටෙන්ඩර් දීම වෙනුවෙන් ආපසු ගෙවන තැන්පතු මුදල නිදහස් | 20,000.00 | නිර්දේශ කරන ලදි. |

| | | | |
|---|---|---|---|
| | කිරීම. | | |
| 8 | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම. | 9,856.00 | නිර්දේශ කරන ලදී. |
| 9 | එම්.එස්.කේ.මහානායක මයා, ආදායම් පරීක්ෂක - ආදායම් එකතු කිරීමට යාම වෙනුවෙන් 2023 අප්‍රේල් හා මැයි මස සඳහා ගමන් වියදම් ගෙවීම. | 5,000.00 | නිර්දේශ කරන ලදී. |
| 10 | එස්.එම්.ඒකනායක මයා, ආදායම් පරීක්ෂක(වැ.බ.) - ආදායම් එකතු කිරීමට යාම වෙනුවෙන් 2023 මාර්තු, අප්‍රේල් හා මැයි මස සඳහා ගමන් වියදම් ගෙවීම. | 7,500.00 | නිර්දේශ කරන ලදී. |
| 11 | ආර්.එම්.පී.අශෝකා මිය, පුස්තකාල සහයක - 2023 මැයි මස ගමන් වියදම් ගෙවීම. | 980.00 | නිර්දේශ කරන ලදී. |
| 12 | ඩී.එම්.ධනපාල මයා, කෙසෙල්වත්ත, මීගහකිවුල - පුංචි ලෝකාන්තයේ ජල නල පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් මිළ ගණන් පියවීම. | 4,950.00 | නිර්දේශ කරන ලදී. |
| 13 | කළමනාකරු, රත්න සුපර් සිටි, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු පොදු පහසුකා මධ්‍යස්ථානය සඳහා මිළදී ගත් ද්‍රව්‍ය සඳහා මිළ ගණන් පියවීම. | 4,940.00 | නිර්දේශ කරන ලදී. |
| 14 | කළමනාකරු, රත්න සුපර් සිටි, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු පොදු පහසුකා මධ්‍යස්ථානය සඳහා මිළදී ගත් ද්‍රව්‍ය සඳහා මිළ ගණන් පියවීම. | 3,240.00 | නිර්දේශ කරන ලදී. |
| 15 | ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙය, සභා ලේකම් - පළාත් පාලන ආයතන විසුරුවා හැරීම මත එම පනත්වල විධිවිධාන අනුව එහි බලතල, කාර්යයන් ඉටුකිරීම සඳහා ප්‍රාදේශීය සභා ලේකම්වරුන්ට විශේෂ බලතල පැවරීම අනුව ගෙවන ලද මාසික දීමනාව ගෙවීම.(2023 අප්‍රේල් හා මැයි මස) | 40,000.00 | නිර්දේශ කරන ලදී. |
| 16 | එම්.කේ.දයාවංශ මයා, නො.6, උඩමතුඩ, වටගොමමන, පිටමාරුව - පිමාරුව සතිපොළ පිරිසිදු කිරීම වෙනුවෙන් දීමනා ගෙවීම. 2023 ජනවාරි, පෙබරවාරි, මාර්තු හා අප්‍රේල් මස | 9,500.00 | නිර්දේශ කරන ලදී. |
| 17 | ඩී.එම්.ප්‍රේමාවතී මිය, මහජන පුස්තකාලය, පිටමාරුව - 2023 වර්ෂයේ මාර්තු සහ අප්‍රේල් මස වලට අදාල පිටමාරුව සතිපොල බදු මුදල් එකතු කිරීම වෙනුවෙන් මාසික දීමනා ගෙවීම. | 2,000.00 | නිර්දේශ කරන ලදී. |
| 18 | ඒ.එල්.ඒ.ඩී.චන්දිම මයා, ප්‍රජා සංවර්ධන නිලධාරී - 2023/01/28 දින භාණ්ඩ සමීක්ෂණ රාජකාරි කටයුතු සිදු කිරීම වෙනුවෙන් නිවාඩු දින වැටුප් ගෙවීම. | 1,374.00 | නිර්දේශ කරන ලදී. |
| 19 | ඒ.එල්.ඒ.ඩී.චන්දිම මයා, ප්‍රජා සංවර්ධන නිලධාරී - භාණ්ඩ සමීක්ෂණ රාජකාරි කටයුතු සිදු කිරීම සඳහා මීගහකිවුල ප්‍රාදේශීය සභාව වෙත යාම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම. | 9,766.40 | නිර්දේශ කරන ලදී. |
| 20 | කළමනාකරු, අයි.එස්.මාර්කටින්, නුවර පාර, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු කිරිහල අලුත්වැඩියා කටයුතු සඳහා මිළදී ගත් ද්‍රව්‍ය සඳහා මිළ ගණන් පියවීම. | 3,850.00 | නිර්දේශ කරන ලදී. |
| 21 | ඩී.එම්.ධනපාල මයා, කෙසෙල්වත්ත, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු කිරිහල අලුත්වැඩියා කටයුතු සඳහා මිළදී ගත් ද්‍රව්‍ය සඳහා මිළ ගණන් පියවීම. | 94,625.00 | නිර්දේශ කරන ලදී. |
| 22 | ව්.වසන්ති මිය, වර්ණසූරිය ඔටෝ සර්විස් ඇන්ඩ් මෝටර් ගරාජ්, 15 කණුව, මීගහකිවුල - 2021 ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ පුනරාවර්තන වැඩසටහන යටතේ සිදු කල අලුත්වැඩියාව UPLL-7774 කැබ් රථයට අදාල ගෙවීම් සිදු කිරීම. | 125,000.00 | නිර්දේශ කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| 23 | වී.වසන්ති මිය, වර්ණසූරිය ඔටෝ සර්විස් ඇන්ඩ් මෝටර් ගරාජ්, 15 කණුව, මිගහකිවුල - අප සභාව සතු 252-6368 කැබ් රථය 2021 ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ පුනරාවර්තන වැඩසටහන යටතේ සිදු කල අලුත්වැඩියාව අදාල ගෙවීම් සිදු කිරීම. | 243,400.00 | නිර්දේශ කරන ලදී. |

- ඉහත අනු අංක 17ට අදාළව නිත්‍ය රාජකාරිවට අමතර රාජකාරියක් කරන නිසා ඇප තැන්පතු මුදලක් රඳවා තබා ගත යුතු අතර ඒ සඳහා ඉදිරි අවශ්‍ය කටයුතු කාර්යාල පිළිවෙල හා කාර්ය පටිපාටිය අනුගමනය කිරීම සඳහා නිර්දේශය ලබා දීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

- ඉහත අනු අංක 22 හා 23ට අදාළව අවසාන ගිණුම් වල සමුච්චිත අරමුදලට ගැලපීම් සිදු කර ජර්නල් සටහන් නිවැරදිව සටහන් කිරීමෙන් පසුව ගෙවීම් කිරීමට හා පළාත් යාන්ත්‍රික දෙපාර්තමේන්තුව මගින් ලබා දුන් පසු පරීක්ෂාව පදනම් කර ගෙවීම් කටයුතු සඳහා අවශ්‍ය කටයුතු කිරීම සඳහා නිර්දේශය ලබා දීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

b. මිගහකිවුල ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු කොන්ත්‍රාත් පදනමින් බඳවා ගන්නා ලද සේවකයින්, ආදේශක පදනමින් බඳවා ගන්නා ලද සේවකයින් හා අනියම් සේවකයින් සඳහා 2023 මැයි මස වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

c. පෝස්ට් මාස්ටර් ජනරාල්ගේ මහජන බැංකුවේ අංක 010100179027344 ගිණුමට බැර - නිදහස් තැපැල් මුද්දර ගාස්තු ප්‍රතිපූර්ණය කිරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

II. මිගහකිවුල ප්‍රාදේශීය සභාවේ 2023 මැයි මස මාසික ආදායම් සාරාංශය (ප්‍රා.ස.16) සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලදී.

- වර්ෂයේ අයවැය වාර්තාව අනුව වර්ෂයේ අපේක්ෂිත ආදායම , පසුගිය මස වල ලැබූ සත්‍ය ආදායම හා ඉදිරියට අපේක්ෂිත ආදායම අනුව සසඳා බලා ඒ අනුව ගත හැකි නිගමනය සඳහන් කර ඉදිරි කමිටුව සඳහා ඉදිරිපත් කරන ලෙස කමිටුව තීරණය කරන ලදී.

III. මිගහකිවුල ප්‍රාදේශීය සභාවේ 2023 මැයි මස මාසික ගෙවීම් සාරාංශය (ප්‍රා.ස.14) සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලදී.

- වර්ෂයේ අයවැය වාර්තාව අනුව වර්ෂයේ අපේක්ෂිත වියදම . පසුගිය මස වල වැයවූ සත්‍ය වියදම හා ඉදිරියේදී වියදම් දැරීමට අවශ්‍ය ප්‍රතිපාදන සපුරා ගැනීමට හැකිද යන වග බලා ඒ අනුව ගත හැකි නිගමනය සඳහන් කර ඉදිරි කමිටුව සඳහා ඉදිරිපත් කරන ලෙස කමිටුව තීරණය කරන ලදී.

IV. මිගහකිවුල ප්‍රාදේශීය සභාවේ 2023 මැයි මස සභාවේ වාහන සඳහා ඉන්ධන භාවිතය පිළිබඳ වාර්තාව සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලදී.

- පසුගිය මාස වල වාහන සඳහා ඉන්ධන ලබා ගැනීම සඳහා වැය වූ මුදල හා අදාල මාසය සඳහා වාහන සඳහා ඉන්ධන ලබා ගැනීම සඳහා වැය වූ මුදල සඳහන් කර ප්‍රස්ථාර

සටහනක් හා ඉන්ධන ලීටරයක වෙනස් වූ මිල සඳහන් කර ඉදිරි කමිටුව සඳහා ඉදිරිපත් කරන ලෙස කමිටුව තීරණය කරන ලදී.

V. මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු පොදු පහසුතා මධ්‍යස්ථානය, සෞඛ්‍ය කම්කරු නිලධාරින්ට, රියදුරු මහතුන් හට හා කාර්යාලයේ අවශ්‍යතාවයන් සඳහා මාසයකට අවශ්‍ය ද්‍රව්‍ය සැලකිල්ලට ගනිමින් පහත සඳහන් පරිදි මාස 06කට එකවර මිලදී ගැනීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

| අනු අංකය | විස්තරය | ද්‍රව්‍ය | මසකට අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | පොදු පහසුතා මධ්‍යස්ථානය | i. සබන් කෑට | 08 |
| | | ii. කපුරු පැකට් | 02 |
| | | iii. හාපික් බෝතල් | 05 |
| | | iv. ලයිසොල් බෝතල් | 04 |
| | | v. ක්ලෝරින් | 02kg |
| 02. | සෞඛ්‍ය කම්කරු හතර දෙනාට | i. සබන් | 16 |
| 03. | කාර්යාලයේ අවශ්‍යතාවයන් සඳහා | i. විම් සබන් | 03 |
| | | ii. සබන් | 04 |
| | | iii. හාපික් | 04 |
| 04. | රියදුරන්ට | i. සබන් | 06 |

- මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සේවය නියුතු කම්කරු නිලධාරින් හට තම සෞඛ්‍ය පහසුකම් සපයා ගැනීම සඳහා සුදුසු ස්ථානයක් පිලියෙල කිරීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු කිරීම සඳහා කමිටුව තීරණය කරන ලදී.

VI. 2023/05/25 දින පැවති පුස්තකාල උපදේශන කමිටු වාර්තාව සම්බන්ධව ඉදිරිපත් කරන ලදී.

- පුස්තකාල උපදේශන කමිටුවේදී සාකච්ඡා කරන ලද 2022 භාණ්ඩ සමීක්ෂණ නිර්දේශයට අනුව පොත 44ක් ඌණ ලේඛණයේ සඳහන් කර ඇත අතර ඉන් පොත් 9කට, පෙර සේවය කළ පුස්තකාල සහයක විසින් මුදල් ගෙවා ඇති අතර පොත් 5ක මිළ සඳහන් කර නොමැත. ඉතිරි පොත් 30 හා පුස්තකාලය ආරම්භයේ සිටි සහයිකාවගේ සේවා කාලයේ නැති වූ එවා බැවින් එවා පරිග්‍රහණයෙන් ඉවත් කිරීමට සඳහා අවශ්‍ය අනුමැතිය සඳහා කළමනාකරණ කමිටුව වෙත යොමු කරන ලෙස පුස්තකාල උපදේශණ කමිටුව විසින් තීරණය කරන ලදී.
  - ❖ ඒ අනුව ඉදිරි කමිටුව සඳහා ඌණ ලේඛණය ඉදිරිපත් කරන ලෙස කමිටුව විසින් තීරණය කරන ලදී.

වෙනත් කරුණු යටතේ පහත කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

01) මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු UPRD-6200 ට්‍රැක්ටර් රථය සඳහා ඉදිරිපස ටයර් යුගලයක් අවශ්‍ය බව එහි රියදුරු මහතා විසින් දන්වා ඇති අතර එම රථය සඳහා මීට පෙර ටයර් යුගලයක් ලබා දී ඇත්තේ 2019.01.01 වන දින බව උක්ත රථයෙහි ලොග් සටහන අනුව නිරීක්ෂණය වේ. අදාල රථය සඳහා 600*16 Ceat එක් ටයරයක් රු:13,375.00 බැගින් වූ ටයර් යුගලයක් සිලවරි ටයර් ඩීලර්ස්, බදුල්ල ආයතනය මගින් මිලදී ගෙන රථය සඳහා යොදා ඇති අතර එම ටයර් අංක SA160223017 හා SA1373333117 වේ. ඒ අනුව රථයට ටයර් යුගලය යොදා වසර 04ක කාලයක් ධාවනයේ යොදවා ඇති බැවින් රථය පරීක්ෂා කර බලා කාර්මික නිලධාරි මහතා විසින් නව ටයර් යුගලයක් යෙදීම නිර්දේශ කර ඇත. මෙම රථය දෛනික රාජකාරියේ යොදවන රථයක් බැවින් මේ සඳහා ටයර් යුගලයක් ලබා ගැනීමට අවශ්‍ය මිළ ගණන් කැඳවීමට ඉදිරි අවශ්‍ය කටයුතු කිරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

02) මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ යන්ත්‍ර සහයක තනතුරේ(කොන්ත්‍රාත් පදනම මත) සේවය කරන ආර්.එම්.සී.ඩී.රත්නායක මහතා එම තනතුර සඳහා 2016.07.01 දින සිට පත් කර ඇති අතර එම දින සිට වාර්ෂිකව සේවය දීර්ඝ කිරීම 2022.06.30 දින දක්වා සිදු කර ඇත. එම සේවක මහතා 2021.07.01 දින සිට මාස දෙකක කාලයක් සඳහා වැඩ, පැමිණීම, හැසිරීම සම්බන්ධයෙන් පරීක්ෂණ කාලයකට යටත් කර ඇති අතර එම මාස දෙකක කාල සීමාව තුළ ඔහු සේවයෙන් ඉල්ලා අස්වී ඇත. නැවත 2022.09.26 දින නැවත සේවය ලබා දෙන ලෙස ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මෙම ආයතනය තුල යන්ත්‍ර සහයක තනතුර සඳහා වන අවශ්‍යතාවය මත නැවත යන්ත්‍ර සහයක තනතුර සඳහා මෙම මහතා යන්ත්‍ර මඟින් උපයා ගන්නා ආදායම අනුව හෝ මසකට දින 10කට යටත්ව ගෙවීම් කිරීමේ පදනම මත 2022.09.26 දින සිට 2023.09.25 දින දක්වා වර්ෂයක කාලයක් සඳහා සේවය දීර්ඝ කර ඇත. වර්තමානයේ පවතින ආර්ථික තත්වය හේතුවෙන් එම මහතා හට දින 10ක වැටුප් ගෙවීම ප්‍රමාණවත් නොවන හෙයින් තම ජීවිකාව ගෙන යාමට අසීරුදායක බව පවසමින් පෙර පරිදි මාසික වැටුප ලබා දීමට අවශ්‍ය කටයුතු කර දෙන ලෙස ඉල්ලීමක් කරන ලදී. ඒ අනුව පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කිරීමෙන් දී කළමනාකරණ කමිටුවේ එකඟතාවය පරිදි තිරණය කිරීම සඳහා උපදෙස් ලබා දුන් අතර ඒ සඳහා අවශ්‍ය තිරණය සඳහා ඉදිරිපත් කරන ලදී.

- ආර්.එම්.සී.ඩී.රත්නායක මහතාගේ ඉල්ලීම සලකා බලා සේවා අවශ්‍යතාවන් මත උපරිම දින 15කට රාජකාරි කටයුතු සඳහා වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු කිරීම සඳහා හා ඔහුගේ වැඩ, හැසිරීම, පැමිණීම සම්බන්ධයෙන් සලකා බලා ඉදිරි වර්ෂයට මාසික වැටුප ගෙවීම සම්බන්ධයෙන් සලකා බැලීමට සුදුසු බව කමිටුව තිරණය කරන ලදී.

03) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ Rainbow Pages ව්‍යාපාර විස්තර වාර්තා ප්‍රදර්ශණය කිරිම සම්බන්ධව රු: 5,893.75 ගෙවීම යටතේ පළ කිරීමට එවන ලද ඉල්ලීම නිර්දේශ නොකිරීමට තිරණය කරන ලදී.

04) මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ජල පිරිපහදු ඒකකය සකස් කිරීමේදී ජල සාම්පල් පරීක්ෂා කර බැලීමට හා ජල පිරිපහදු ඒකකය සඳහා අවශ්‍ය විදුලිය පැරණි කාර්යාලයෙන් සපයා ගෙන ඉදිරි අවශ්‍ය කටයුතු කිරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කමිටුව තිරණය කරන ලදී.

- ජල පිරිපහදු ඒකකයේ ජල ටැංකිය තැබීම සඳහා ආධාරකයක් සකස් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කමිටුව තිරණය කරන ලදී.

05) මීගහකවුල ප්‍රාදේශීය සභාව සතු ටොන් 08 ගල් රෝල වාර සේවාව සිදු කිරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කමිටුව තිරණය කරන ලදී.

06) මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන උප ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත් පිරිනැමීමේ කමිටුව මඟින් කරමැටිය කඩ කාමර වල බිම් සකස් කිරීමට කොන්ත්‍රාත් සමිතියකට ලබා දීම හා ඒ අදාළ ගිවිසුම සඳහා කමිටු නිර්දේශය ලබා ගැනීමෙන් පසුව කළමනාකරණ කමිටුව නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

- ඒ අනුව කරමැටිය කඩ කාමර බිම් සකස් කිරීම සඳහා සභාපති, ග්‍රාම සංවර්ධන බල මණ්ඩලය සමිතියට ලබා දීමට හා ඒ අදාල ගිවිසුම සඳහා උප ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත් පිරිනැමීමේ කමිටු නිර්දේශය මත ඉදිරි අවශ්‍ය කටයුතු සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කමිටුව තිරණය කරන ලදී.

07) මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු කරමැටිය කඩ කාමර 03 ටෙන්ඩර් කරනු ලැබුවත් කිසිම ඉල්ලීමක් නොතිබුණි. නමුත් ඉන් පසුව එම කඩ කාමර සඳහා ඉල්ලීම් කිහිපයක් ලැබුණු අතර එම ඉල්ලීම් කිහිපයෙන් උපරිම මුදලක් දැක්වූ පුද්ගලයින් 03දෙනෙක් සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත

ලබා දුන් අතර එයින් දෙදෙනෙක් එම කඩ කාමර කිරීමට නොහැකි බව දන්වා වෙන පුද්ගලයින් දෙදෙනෙකු නම් කොට එම කඩ කාමර එම පුද්ගලයින් දෙදෙනා හට ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර ඒ සම්බන්ධව අවශ්‍ය නිර්දේශය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

- ඒ පිළිබඳ විෂය භාර අමාත්‍යවරයාගේ වෙත යොමු කර ඒ උපදෙස් මත ක්‍රියා කරන ලෙස කමිටුව තීරණය කරන ලදී.

08) මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ කාර්යාල ප්‍රයෝජනය සඳහා සංග්‍රහ කටයුතු වෙනුවෙන් අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා හා කාර්යාලයට අවශ්‍ය මේස රෙදි, නාම පුවරු සකස් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

09) මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සේවය කරන නිලධාරීන් හට රාජකාරී හැඳුනුම්පතක් සකස් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

දිනට නියමිත කරුණු අවසන් බැවින් හා සාකච්ඡා කිරීමට වෙනත් කාරණා නොමැති බැවින්, සභා ලේකම්තුමියගේ ස්තූති කතාවෙන් අනතුරුව කළමනාකරණ කමිටුව පෙ.ව.11.00ට අවසන් කරන ලදී.

**කමිටු සාමාජිකයින්:-**

1) ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙනවිය (සභාපති) -
2) ඩබ්.ඒ.එස්.ආර්.විජේසිංහ මහතා (කමිටු සාමාජික) -
3) ඒ.එල්.ඒ.ඩී.චන්දිම මහතා (කමිටු සාමාජික) -
4) ආර්.එම්.එල්.ජේ.රත්නායක මහතා (කමිටු සාමාජික) -
5) ජී.කේ.ද සොයිසා මහත්මිය (කමිටු සාමාජික) -
6) ඒ.ජී.චිත්‍රා මල්කාන්ති මහත්මිය (කමිටු සාමාජික) -
7) කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම් මහතා (කමිටු සාමාජික) -